# චිත්‍ර කලාව

## 12 වසර - තෙවන වාරය

කාලය 2020.06.15 සිට 2020.06.19 දක්වා සතිය | දිනය : 2020.06.15

නිපුණතාව : 6.0 | නිපුණතා මට්ටම : 6.5

පාඩම : 6.5.3. උපස්ථිතිවාදීන්ගේ නිර්මාණ අධ්‍යයනය කරමු. (මේරි කසාට්)

### 01 කොටස

❖ **හිස්තැනට සුදුසු නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. චිත්‍ර හා ...................... ශිල්පිනියක් වූ මේරි කසාට් ඇමරිකානු ජාතික කාන්තා චිත්‍ර ශිල්පිනියකි.
   i නාට්‍ය ii ග්‍රැෆික් iii මූර්ති iv මුද්‍රණ
2. මේරි කසාට් 1877-1886 කාලයේ උපස්ථිතිවාදී කලා ප්‍රවණතාවය තුළ සක්‍රීය ව සිටි ...................... ශිල්පිනියකි.
   i අධි තාත්විකවාදී ii ස්ත්‍රීවාදී iii ඝනිකවාදී iv ස්වභාවිකවාදී
3. මේරි කසාට්ගේ නිර්මාණ සඳහා ........................ ගේ ආභාසය ලදැයි සැලකේ.
   i එඩ්ගා ඩෙගා ii පෝල් සෙසාන් iii ක්ලෝඩ් මොනේ iv පොල් ගොගැන්
4. .......................... සිතුවම කසාට් විසින් අඳින ලද ආන්දෝලනාත්මක පෙරටුගාමී චිත්‍රයකි.
   i හිසකෙස් සකසන ගැහැණු ළමයා ii ස්නානය iii නිල් කාමරය iv නාන බේසම
5. සුවිශේෂී නොවන චිත්‍රයක් සුවිශේෂීව දැක්වීම ........................... චිත්‍රයේ විශේෂත්වයකි.
   i නිල් කාමරය ii නාන බේසම iii ස්නානය iv හිසකෙස් සකසන ගැහැණු ළමයා
6. නිල් කාමරය චිත්‍රයේ මධ්‍යගතව ...................... නොමැති බැවින් සමස්ත සංරචනය ප්‍රධාන කර ඇත.
   i විශාල රූපයක් ii ප්‍රධාන රූපයක් iii කුඩා රූපයක් iv අවශේෂ රූපයක්
7. හිසකෙස් සකසන ගැහැණු ළමයා සිතුවමේ එකිනෙකට වෙනස් ................. භාවිත කර ඇත.
   i මිශ්‍ර වර්ණ ii උණුසුම් වර්ණ iii සංගත වර්ණ iv නුමුහුන් වර්ණ
8. හිසකෙස් සකසන ගැහැණු ළමයා සිතුවමේ ............... අත්‍යාවශ්‍ය අංගයක් සේ නිරූපණය කර නැත.
   i පසුබිම ii මැදබිම iii අවකාශය iv පෙරබිම
9. ස්නානය චිත්‍රයෙන් මේරිගේ ජනප්‍රිය තේමාවක් වන ............... ඉදිරිපත් කර ඇත.
   i පීතෘත්වය ii මාතෘත්වය iii ස්ත්‍රීත්වය iv පෞරුෂත්වය
10. බොහෝ උපස්ථිතිවාදී චිත්‍රවල මෙන් ............... ස්නානය චිත්‍රයන් ද නිරූපණය නොවේ.
   i ක්‍රියාකාරී දර්ශනයක් ii අභ්‍යන්තර දර්ශනයක් iii විවෘත දර්ශනයක් iv එළිමහන් දර්ශනයක්

❖ **පහත ප්‍රශ්න අංක 11 සිට 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

11. මේරි කසාට් ගේ ප්‍රධාන චිත්‍ර මාතෘකා වූයේ මෙනවා ද ? ..............................................................................
.....................................................................................................................................................

සැකසුම හා සංස්කරණය ( එම්.ඩී.ඉසුරු ධනුෂ්ක මඩපාත. ර/ අනුර මහා විද්‍යාලය, ගැටහැත්ත.
(Multi-Disciplinary Design – Visual Art (Special) Hons)
University of Visual & Performing Arts
071 4800 405

12. මේරි කසාට්ගේ චිත්‍රවල දැකිය හැකි ලක්ෂණ 04ක් සඳහන් කරන්න.

i ........................................................................................ ii ........................................................................................

iii ........................................................................................ iv ........................................................................................

13. නිල් කාමරය සිතුවමින් නිරූපණය වන්නේ කුමක්ද ? ..........................................................................................

14. නිල් කාමරය සිතුවමේ වර්ණ භාවිතය පිළිබඳ කුමක් කිව හැකිද ? ..........................................................................................

..........................................................................................................................................................

15. හිසකෙස් සකසන ගැහැණු ළමයා සිතුවමින් නිරූපණය වන්නේ කුමක්ද ? ..........................................................................................

..........................................................................................................................................................

16. හිසකෙස් සකසන ගැහැණු ළමයා සිතුවමින් පිළිබිඹු වන්නේ කුමන ආභාසයක් ද ? ..........................................

17. හිසකෙස් සකසන ගැහැණු ළමයා සිතුවමේ සංරචනය පිළිබඳ කුමක් කිව හැකිද ? ..........................................

..........................................................................................................................................................

18. ස්නානය සිතුවමෙන් නිරූපණය වන්නේ කුමක්ද ?

..........................................................................................................................................................

19. ස්නානය සිතුවමෙන් දැකිය හැකි ශාස්ත්‍රාලීය චිත්‍ර කලාවේ ලක්ෂණ මොනවාද ?

i ..........................................................................................................................................................

ii ..........................................................................................................................................................

20. ස්නානය සිතුවමේ සම්පිණ්ඩණය පිළිබඳව අදහස් දක්වන්න. ..........................................................................................

..........................................................................................................................................................

## <u>02 කොටස</u>

❖ **පහත දැක්වෙන ප්‍රශ්න සඳහා ව්‍යුහගත පිළිතුරු සපයන්න.**

1. මේරි කසාට්ගේ සිතුවම් නම් කරන්න.
2. මේරි කසාට් වස්තු විෂය හා ශිල්ප ක්‍රම සම්බන්ධයෙන් උපස්ථිතිවාදී කලාවට සැපයූ දායකත්වය සාකච්ඡා කරන්න.